CONFEDERATION OF MSME INDUSTRIES

CONFEDERATION OF MICRO, SMALL AND MEDIUM INDUSTRIES
ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍යම කර්මාන්ත සම්මේලනය
சிறிய மற்றும் நடுத்தர தொழில் அமைப்புகளின் சம்மேளனம்

**මාධ්‍ය නිවේදනය**
**2019 ඔක්තෝබර් 16**

# කොස්මි හරහා ශ්‍රී ලංකාවේ පෞද්ගලික අංශය විසින්, මෙරට කාර්මික ක්ෂේත්‍රයේ පුනර්ජීවනය සඳහා මහගු මෙහෙවරක් ආරම්භ කෙරේ

ශ්‍රී ලංකාවේ කාර්මික අංශය පුනර්ජීවනය සහ පෝෂණය කිරීම සඳහා 2019 වසරේදී ඇපයෙන් සීමිත, ලාභ නොලබන සමාගමක් ලෙස කොස්මි, එනම් "ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍යම කර්මාන්ත සම්මේලනය", ආයතනයක් ලෙස සංස්ථාගත කරන ලදි.

ශ්‍රී ලංකා වානිජ මණ්ඩලය ක්‍රියාකාරකම තුල ඉහල ගෞරවයට පාත්‍ර වූ පුද්ගලයින් කණ්ඩායමක් විසින් ආරම්භ කරනලද මෙම සමාගම ශ්‍රී ලංකාවේ කර්මාන්ත අංශයේ හරස්කඩක් නියෝජනය කරන අතර ඔවුන්ගේ එකම දැක්ම වනුයේ "ශ්‍රී ලංකාවේ ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍යම කර්මාන්තයන්හි හඬ" නොහොත් "Voice of Industrial MSMEs in Sri Lanka" වීමටයි.

කොස්මි යනු දශක හතරකට වැඩි කාලයක් තුල වාණිජ්‍යය මණ්ඩලය ව්‍යාපාරයට ශක්තිමත් සේවයක් කල දූරදර්ශී ව්‍යාපාරික වෘත්තිකයකු වන නවාස් රාජබ්දීන් මහතාගෙ මහගු සංකල්පයකි. ඔහු මෙන්ම අනෙකුත් සියළු ආරම්භක සාමාජිකයින්ද ස්වේච්ඡාවෙන් මෙම කර්තව්‍යට දායක වන්නේ, ශ්‍රී ලංකාවේ කාර්මික අංශය සඳහා තිරසාර අනාගතයක් නිර්මාණය කිරීමට ඇති අධිෂ්ඨානයට දැඩිව කැපවී සිටින නිසාවෙනි. එමගින් අනාගත පරපුර හට කල්පවත්නා, යහපතක් හා ධනාත්මක උරුමයක් ඉතිරි කර යාම ඔවුන්ගේ උතුම් අදහස වේ.

කොස්මි ආරම්භක සාමාජිකයින් පාලක මණ්ඩලයක් සහ අධශක්ෂක මණ්ඩලයකින් සමන්විත වේ. පාලක මණ්ඩලයට දේශබන්දු මැකී හශීම් මහතා සභාපති ලෙස නායකත්වය දෙන අතර ඩඩ්ලි තම්බිනයගම්, ආර්චර්ය රොහාන් කරුණාරත්න, ආචාර්ය ජගත් පීරිස් සහ හුයි බන්ඩාරනයක යන මහත්ම මහත්මින් එහි සාමාජිකත්වය දරයි.

කොස්මි පළමු මහ සභා රැස්වීමේදී නවාස් රාජබ්දීන් මහතා පාලක සභාව විසින් ආරම්භක සභාපති ලෙස ඒකමතිකව නම් කරන ලදි. කොස්මි ආරම්භක අධ්‍යක්ෂක මණ්ඩලයේ අනෙකුත් සාමාජිකයින් වන්නේ ඉන්ද්‍රා කෞෂාල් රාජපක්ෂ (උප සභාපති), කීර්ති ගුණවර්ධන, අයන්ති ගුරුසිංහ, රමල් ජාසිංහ හා රාජරාම්මොහාන් යන මහත්ම මහත්මීන්ය.

කොස්මි හි වැදගත් අංගයක් වන්නේ එහි උපදේශක මඩුල්ලයි. එම මඩුල්ල තුල කෘෂි ව්‍යාපාර, කෘෂි පර්යේෂණ සහ සංවර්ධනය, වෙළඳපොල පිලිබඳ පර්යේෂණ සහ විශ්ලේෂණය, වර්ධන උපායමාර්ග සහ පුහුණුව, ව්‍යාපාර ප්‍රතිව්‍යුහගතකරණය, ව්‍යාවසායක සංවර්ධනය වැනි අංශයන්හී ප්‍රමුඛ පෙලේ විද්වතුන් හා වෘත්තීකයින් පිරිසක් සිටී. තවද කාන්තා සවිබල ගැන්වීම, තිරසාර බලශක්තිය සහ පිරිසිදු නිෂ්පාදනය, උසස් යන්ත්‍රෝපකරණ, සැපයුම් දාමය, ව්‍යපාර ශක්‍යයතා අධ්‍යනය සහ ව්‍යපාර යෝජනා යන දෑ අනෙකුත් ප්‍රධාන අංග වේ. MSMEs පෝෂණය කිරීමට සහ සවිබලගැන්වීමට සහ පවතනා දැනුම හා තාක්ෂණික හිඩැස් පිරවීමටත් මෙම කමිටුව මගින් විශාල කාර්යභාරයක් ඉටු කරනු ඇත.

කොස්මිහි ලියාපදිංචි වී ඇති ආයතන සඳහා මූලික උපදේශක සහාය නොමිලේ ලබා දෙන අතර පසුකාලීනව සේවාවන් සඳහා සාධාරණ ගාස්තුවක් අය කරනු ඇත.

කාර්මික MSME කාණ්ඩ වලට රබර්, රබර් පදනම් භාන්ඩ, ප්ලාස්ටික්, සත්ව හම, ලෝහ, තන්තු, කඩදාසි, ගෘහභාණ්ඩ, ලී-වැඩ, මැණික් හා ස්වර්ණාභරන, පොල් හා පොල් පදනම් දෑ, කෘෂි ව්‍යපාර හා කෘෂි නිෂ්පාදන, කඩදාසි, ප්ලාස්ටික්, රබර් හා කර්මික අපද්‍රව්‍ය ප්‍රතිචක්‍රීකරණය, මුද්‍රණ හා ඇසුරුම්, සහැල්ලු ඉංජිනේරු, මෙවලම්, දෘඩාංග හා ඊට අනුබද්ධ යන්ත්‍රෝපකරණ අඩංගු වේ.

කොස්මි සිය ව්‍යාපාර මැදිහත්වීමේ උපායමාර්ග තුල තිරසාර සංවර්ධන ඉලක්ක පෙලගැස්වීම, චක්‍රාකාර ආර්ථික මූලධර්ම, කලාපීය තාක්ෂණය උපයොගී කර ගැනීම, සෙවා අංශ ශක්තිමත් කිරීම, කලාපීය හා ජාත්‍යන්තර සහයෝගතා ඇති කර ගැනීම සහ ජාත්‍යන්තර වෙළද මධ්‍යස්ථානය විසින් හන්දුන්වාදී ඇති සුළු හා මාධ්‍ය පරිමාණ ව්‍යාපාර තරඟකාරීත්වය සඳහා අනුගමණය කල හැකි සාර්ථකත්ව සාධක අඩංගු වේ.

උතුරු හා නැගෙනහිර පලාත්වල කාර්මික සංවර්ධනයට විශේෂ අවධානයක් වොමු කෙරෙන අතර, එම කලාපයන්වල සාර්ථකව ක්‍රියාත්මක කල හැකි වියාපෘති කීපයක්ම දැනටමත් කොස්මි ආයතනය විසින් හඳුනාගෙන තිබේ.

දේශීය MSME කාර්මාන්ත හට සුදුසු අවස්ථාවන් ලබාදීම, දැනුම පරතරය තුනී කිරීම, කොස්මි ප්‍රතිලාභීන් සඳහා කලාපීය හා ජාත්‍යන්තර සන්ධාන සහ හවුල්කාරිත්වය හරහා ක්‍රියාකාරීත්ව රැසක් පෙලගස්වා ඇත. මෙම ක්‍රියාකාරකම් නොබෝ දිනකදී කොස්මි විසින් ප්‍රකාශයට පත් කිරීමට නියමිතයි.

ලියාපදිංචි ගාස්තුව රු. 2500 ක් වැනි සුළු මුදලක් වන අතර, මෙමගින් ලියාපදිංචි ආයතනයන්ට සුවිශේෂී ප්‍රතිලාභ රැසක් ලබා ගැනීමට හැකි වනු ඇත. ලියාපදිංචි වීමේ ආකෘති පත්‍රය ලබාගැනීම සඳහා දුරකථන 0770083388 අමතන්න, නැතහොත් විද්‍යුලි ලිපිණය වන info@cosmi.lk වෙත ඔබගේ පැණයන් යොමු කරන්න.

Reviving Sri Lanka's Industrial Sector through MSMEs